(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 3(7).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2019 සැප්තැම්බර් 20 වැනි සිකුරාදා**

---

## 2019 ඔක්තෝබර් 08 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

කාලාවරෝධ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග (අංක 1),— 2018 අංක 35 දරන මුදල් පනතේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 19 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.09.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග (අංක 2),— 2018 අංක 35 දරන මුදල් පනතේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 19 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 මාර්තු 07 දිනැති අංක 2113/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.09.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග (අංක 3),— 2018 අංක 35 දරන මුදල් පනතේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 19 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 අප්‍රේල් 09 දිනැති අංක 2118/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.09.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— මූල්‍ය ව්‍යාපාර පනත යටතේ නියෝග,— 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ 69 වගන්තිය සමඟ කියවිය යුතු 33 වගන්තිය යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් ගණන් බේරා වසා දැමීමේදී හිමිකම් පෑම්වල ප්‍රමුඛතාවය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 මැයි 31 දිනැති අංක 2125/58 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.09.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 අධිකාරය) මෝටර් වාහන පනතේ 164 වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ සලකුණු, සංඥා, සංකේත සහ මාර්ග ලකුණු කිරීම් සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජූනි 18 දිනැති අංක 2128/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.09.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2019 නොවැම්බර් 05 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

55/'18

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ හදබිම අධිකාරිය නමින් ආයතනයක් තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයේ ප්‍රධාන කාර්යයන් කවරේද;

(iii) දැනට එම කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ නම හා ලිපිනය කවරේද;

(iv) මෙම ගොඩනැගිල්ලට මාසිකව හා වාර්ෂිකව ගෙවනු ලබන කුළිය කවරේද;

(v) මෙම ආයතනය කෘෂිකර්ම අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේම ස්ථාපිත කිරීමට අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

129/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපනය කරන ලද වර්ෂය කවරේද;

(ii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ ආරම්භක අරමුණු කවරේද;

(iii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපිත කළ දින සිට අවසන් අධ්‍යක්ෂ මණ්ඩලය දක්වා එහි අධ්‍යක්ෂ මණ්ඩලවල සිටි පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් සහ ලැබූ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ආරම්භයේ සිට ලැබූ අලාභය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ණය, ලබාගත් ණය ගෙවීමට ඇති රාජ්‍ය ආයතන හා එම ණය ප්‍රමාණයන් කවරේද;

(vi) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ අනාගතය සම්බන්ධයෙන් රජය ගැනීමට බලාපොරොත්තුවන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

371/’18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු මහවිල වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

441/’19

ගරු ජයන්ත සමරවීර මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2018.09.01 දින වනවිට කළුතර දිස්ත්‍රික්කය තුළ සිටින හඳුනාගත් ආබාධිත පුද්ගලයන් සංඛ්‍යාව, ආබාධයේ ස්වභාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආබාධිත තත්ත්වයන් සිදුවී ඇත්තේ උපතින්ද; නැතහොත්, අනතුරකින්ද යන්න සහ වයස අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(ii) එම එක් එක් ආබාධිත පුද්ගලයාගේ නම, ලිපිනය, භාරකරුගේ නම, ග්‍රාම නිලධාරි වසම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ආබාධිත පුද්ගලයන් ලබාගන්නා ආධාර මුදල් ප්‍රමාණය හා ඔවුන්ගේ ආබාධයේ ස්වභාවය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ආධාර ලැබිය යුතු එහෙත්, ආධාර නොලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් පිරිස වෙනුවෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

515/’19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් “සහභාගිත්ව සංවර්ධන වැඩසටහන්” යටතේ 2015 වර්ෂයේ සිට මේ දක්වා නිලධාරින් බඳවාගෙන තිබේද;

(ii) එසේ නම්, එම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිලධාරීන් සඳහා මාසික වැටුපක් හෝ දීමනාවක් ගෙවන්නේ නම්, ඒ කොපමණද;

(iv) එසේ බඳවාගත් එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, අයත් වන ග්‍රාම නිලධාරී වසම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යන තොරතුරු අඩංගු ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(vi) එම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත ඵලදායී ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

660/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණු කවරේද;

(ii) එහි කාර්යභාරයන් කවරේද;

(iii) පාරිභෝගික කටයුතුවලට අදාළව සිදු කරනු ලබන කුමන වැරදි සම්බන්ධයෙන් එම අධිකාරියට ක්‍රියා කළ හැකි වන්නේද;

(iv) අධිකාරියේ බලතල හා වැරදිකරුවන්ට එරෙහිව ගතහැකි ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2017 වර්ෂය තුළ එම අධිකාරිය විසින් සිදුකර ඇති,

(i) වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) සිදුකර ඇති දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව සහ ඒවා පැවැත්වූ ස්ථාන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දුර ගමන් සේවා මගී ප්‍රවාහන බස් රථ නවත්වනු ලබන බොහෝ ආපනශාලාවල වැඩි මිලට ආහාරපාන අලෙවි කරමින් ගුණාත්මක භාවයෙන් අඩු ආහාරපාන අලෙවියේ නිරත වන බවත්, පාරිභෝගික වරණය සීමා වීම තුළ පාරිභෝගිකයන් මහත් අපහසුතාවයන්ට ලක් වන බවත් පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

754/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට රිමාන්ඩ් බන්ධනාගාරගතව හෝ සිරගතව සිටින ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ විවිධ තරාතිරම්වල නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගතව හා සිරගතව සිටින පිරිස්ද ඇතුළුව අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති සියලු නිලධාරීන්ට එරෙහිව ගොනු වී ඇති චෝදනා සහ ඒවායේ වර්තමාන තත්ත්වය කවරේද;

(iii) ඒ අතරින් මරණ දඬුවම ලබා සිටින නිලධාරින්ගේ නම්, ලිපිනයන් හා එම තීන්දුවට අදාළ වරද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විවිධ චෝදනා ඉදිරිපත් කරමින් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති ත්‍රස්තවාදය පරාජය කිරීමේ සටනට සහය දුන් ''සත්‍ය ගවේශකයෝ'' සංවිධානයේ නිශාන්ත ද අල්විස් මහතා ඇතුළු විවිධ තරාතිරම්වල සිවිල් පුරවැසියන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

873/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිල්පත් නොගෙවීම හේතුවෙන් අංක 02, ඕතර පාර, වරාදල, මැල්ලවගෙදර ලිපිනයෙහි පිහිටි කේ. එච්. එස්. ඩී. හේමසිරි මහතාගේ වෙළඳසැල සහ නිවසට 2018.01.17 දින විදුලිය විසන්ධි කළේද;

(ii) එම දිනය වනවිට හේමසිරි මහතාගේ විදුලි බිල ඔහුට හෝ නිවසට හෝ ලබා දී නොතිබූ බව පිළිගන්නේද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය දිවුලපිටිය කාර්යාලය මෙම තත්ත්වය පිළිගෙන අතිරේක ගාස්තුවක් නොමැතිව විදුලි සැපයුම යළි ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදුලිය විසන්ධි කර නැවත සම්බන්ධතාවය ලබා දීමට අයකරනු ලබන ගාස්තු හරහා ලං.වි.ම. වසරකට ලබන ආදායම කොපමණද;

(ii) රු.1,250/- හිඟයකට විදුලිය විසන්ධි කළ විට, රු.1,430/-ක් නැවත සම්බන්ධ කිරීමේ ගාස්තුවක් ගෙවීමට සිදුවීමෙන් ජනතාව විශාල දුෂ්කරතාවයකට පත් වන බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

882/'19

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කුඩා වැව්, 'ජපන් ජබර' වැනි ජලජ පැළෑටි මඟින් ආක්‍රමණය කිරීම හේතුවෙන් සීඝ්‍රයෙන් ගොඩ වී ගෙන යන බව දන්නේද;

(ii) එම ජලජ පැළෑටිවල ආක්‍රමණය 'කටියාව වැව' වැනි මධ්‍යම ප්‍රමාණයේ වැව්වලට ද ව්‍යාප්ත වී ඇති බව පිළිගන්නේද;

(iii) මෙම ජලජ පැළෑටිවල ආක්‍රමණය අනාගතයේදී වී වගාවට බලපෑමෙන් එය ජාතික ප්‍රශ්නයක් වීමට ඉඩ ඇති බව පිළිගන්නේද;

(iv) එම ජලජ පැළෑටි ආක්‍රමණය සම්පූර්ණයෙන් නතර කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

936/’19

ගරු මුහම්මදු නසීර් මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිජ්රාපුරම් ගම්මානයේ පදිංචි මුස්ලිම් ජනතාවගේ පාරම්පරික ඉඩම්, යුදමය වාතාවරණය අවසන් වීමෙන් පසුව ඔවුන්ට ලබාදීම ප්‍රතික්ෂේප කර තිබේද;

(ii) හිජ්රාපුරම් ග්‍රාම සංවර්ධන සමිතිය මඟින් “ජනපතිට කියන්න” ජාලගත වැඩසටහන හරහා මුලතිව් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත මේ පිළිබඳව අංක PRE/2017/N/046127 හා 2017.09.18 දිනැති පැමිණිල්ල ඉදිරිපත් කර ඇතත්, ඒ සඳහා මෙතෙක් ස්ථිර විසඳුමක් ලබා දී නොමැති බව දන්නේද;

(iii) ඉහත පැමිණිල්ල හා යොමුගත කරුණු සම්බන්ධයෙන් කඩිනමින් සොයා බලා විසඳුමක් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

937/’19

ගරු විදුර වික්‍රමනායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉංගිරිය, ගාමිණී මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ මුදල් වර්ෂ ගණනාවක සිට සාවද්‍ය ලෙස පරිහරණය කරන බවට සහ තවත් විෂමාචාර පිළිබඳව පළාත් අධ්‍යාපන අභ්‍යන්තර විගණන අංශයට ලැබුණු පැමිණිල්ලකට අනුව විගණන පරීක්ෂණයක් සිදු කළ බවත්;

(ii) විගණන විමසුම අනුව, සාවද්‍ය කටයුතුවලට වගකිවයුත්තන්ට එරෙහිව පියවර ගන්නා මෙන්, හොරණ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරයාගේ සිට බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා දක්වා සියලුම බලධාරීන්ට දැනුම් දී ඇතත්, මේ වනතෙක් විසඳුමක් ලබාදී නොමැති බවත්;

(iii) චූදිතයන් විදුහලෙන් ඉවත් නොකරන්නේ නම්, තමන්ට ස්ථාන මාරුවක් ලබාදෙන ලෙසට විදුහල්පතිවරයාගේ ඉල්ලීම අනුව ඔහුට ස්ථාන මාරුව ලබාදී ඇති බවත්;

(iv) විදුහල නඟා සිටුවීමට මහත් පරිශ්‍රමයක් දැරූ විදුහල්පතිවරයා මාරුකර විදුහල පරිහානියට පත්කළ චූදිතයන් විදුහලේම රඳවා අදාළ මූල්‍ය චෝදනා සුළුකොට සළකා කටයුතු කිරීමෙන් චූදිතයන් බලවත්වීමෙන් දෙමව්පියන් හා ශිෂ්‍යයන් අසරණ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඒ අනුව විදුහලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මුදල් සාවද්‍ය පරිහරණයට යොදවන පුද්ගලයන් ආරක්ෂා කිරීම වැරදි පූර්වාදර්ශයක් නොවන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

938/’19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 මාර්තු මාසයේදී නව රැකියා අවස්ථා 50000ක් ජනනය කිරීමේ අරමුණින් සුවිශේෂ ණය යෝජනා ක්‍රම අටක් හඳුන්වාදුන් බව පිළිගන්නේද;

(ii) එකී එක් එක් ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iii) උක්ත ණය යෝජනා ක්‍රම අට වෙනුවෙන් ලබාදුන් පොලී සහනාධාර ප්‍රමාණය කොපමණද;

(iv) එකී පොළී සහනාධාරය රාජ්‍ය මූල්‍ය ගිණුම්කරණයෙහි සටහන් තබා ඇති ආකාරය කවරේද;

(v) උක්ත ණය යෝජනා ක්‍රම අට යටතේ ආරම්භ කළ නව ව්‍යාපෘති මඟින් ජනිත කළ නව රැකියා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1010/'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගුවන් සේවා සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු හිඟ මුදල් තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් රාජ්‍ය ආයතනයේ නම, හිඟ මුදල සහ හිඟ පවතින කාලය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iii) එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1046/'19

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ සේවය කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ස්ථාන මාරු නොලබා එකම ග්‍රාම නිලධාරි වසම තුළ වසර 5කට අධික කාලයක් අඛණ්ඩව රාජකාරි කටයුතු සිදු කරමින් සිටින බවත්;

(ii) ඒ හේතුවෙන් ජනතාව විවිධ අපහසුතාවයන්ට මුහුණ දෙන බවත්;

(iii) එම ගම්මානවල ජනතාවගේ සංවර්ධන කටයුතුවලද පසුබෑමක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ වසර 5කට අධික කාලයක් රාජකාරියේ නියැලී සිටින සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට ස්ථාන මාරු ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1152/'19

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් නැවත පදිංචි කිරීමේ කටයුතු වෙනුවෙන් තලෛමන්නාරම පියර් ප්‍රදේශයේ පාලමීන් ඕඩෙ නමැති අක්කර 100ක ඉඩමක් ලබාදුන් බව දන්නේද;

(ii) එසේ නම්, මෙම ඉඩමෙහි පදිංචි කිරීමට අපේක්ෂා කළ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉඩම් ලබාදුන් පවුල් හා පොදු ආයතනවල නම් සහ අනෙකුත් විස්තර කවරේද;

(iv) එම ඉඩමෙහි පදිංචි කළ මුල්කාලීන සාමාජිකයන්ගෙන් මේ වනතෙක් පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(v) අතරමැදි කාලයේදී පදිංචි කළ පවුල් සංඛ්‍යාව හා ඔවුන්ගේ තොරතුරු කවරේද;

(vi) මේ වනවිට පදිංචි කරන ලද සමස්ත පවුල් සංඛ්‍යාවෙන් ඉඩම් බලපත්‍ර ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(vii) මේ වනතෙක් ඉඩම් බලපත්‍ර නොලැබුණු සාමාජිකයන්ට ඉඩම් බලපත්‍ර ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 නොවැම්බර් 06 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

60/'18

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොඩ ඉඩම් නොමැති පුද්ගලයන්ට තම කුඹුරු ඉඩමෙන් පර්චස් 10ක කොටසක් ගොඩකර නිවසක් ඉදිකර ගැනීමට අවසර ලබාදීම දීර්ඝ කාලයක සිට පැවති බව දන්නේද;

(ii) දැනට ගොඩ ඉඩම් අහිමි පුද්ගලයන්ට තම කුඹුරු ඉඩමෙන් පර්චස් 10 ක පමණ කොටසක් ගොඩකර නිවසක් ඉදිකිරීම සඳහා ලබා දී තිබූ අවස්ථාව අහිමි කර ඇති බව පිළිගන්නේද;

(iii) එම නිසා දිවයිනේ විවිධ ප්‍රදේශවල ඉඩම් නොමැති විශාල පිරිසක් අසරණ තත්ත්වයකට පත්ව සිටින බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුඹුරු ඉඩමෙන් පර්චස් 10ක ප්‍රමාණයක් ගොඩකර ගැනීම සඳහා මේ වනවිට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයදුම් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම පුද්ගලයන්ට ඉතා කඩිනමින් එම පර්චස් 10ක කුඹුරු ඉඩම් ගොඩකර ගැනීමට අවස්ථා සලසා දෙන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

158/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති මධ්‍යම රජයට හා පළාත් සභාවට අයත් වාරිමාර්ග ක්‍රම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මධ්‍යම රජයට අයත් වාරිමාර්ග ක්‍රම මඟින් අස්වද්දන ලද කුඹුරු ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පළාත් සභාවට අයත් වාරිමාර්ග ක්‍රම මඟින් අස්වද්දන ලද කුඹුරු ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2010 වර්ෂයේ සිට මේ දක්වා මධ්‍යම රජය හා පළාත් සභාව, බදුල්ල දිස්ත්‍රික්කයේ වාරිමාර්ග නඩත්තුවට හා ප්‍රතිසංස්කරණයට වැය කළ මුදල් ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

421/'19

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්තාගත වී ඇති අපරාධ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අපරාධ එක් එක් වර්ග කිරීම් යටතේ ඉදිරිපත් කරන්නේද;

(iii) එම අපරාධ හේතුවෙන් හානි වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015 වර්ෂයේ සිට මේ දක්වා,

(i) අපරාධ මැඩලීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද;

(ii) සිදු කර ඇති අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාව කොපමණද;

(iii) දඬුවම් ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) සිදු වූ අපරාධ අතරින් මෙතෙක් නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකි වූ අපරාධ සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

644/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) Indian Ocean Marine Affairs Cooperation (IOMC) නමැති ආයතනයකට කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ ඉඩ ප්‍රමාණයක් වෙන් කර ඇති බව දන්නේද;

(ii) එසේ වෙන්කර ඇති කාමර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ සඳහා වැය බර දරන්නේ කවුරුන්ද;

(iv) මේ සඳහා රජයේ මුදල් යොදවන්නේ නම්, වාර්ෂිකව ඒ සඳහා වැය කරන මුදල කොපමණද;

(v) රජය විසින් මෙම ආයතනය කොපමණ කාලයක සිට නඩත්තු කරන්නේද;

(vi) එම ආයතනය සඳහා රජයෙන් වැය කරන මුදලට ලැබෙන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1032/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 246ට අනුව, ශ්‍රී ලංකාවේ සාප්පු සවාරි පාරාදීසයක් (Shopping Paradise) ඇති කිරීම සඳහා සිදුකළ ප්‍රධාන බදු සංශෝධන කවරේද;

(ii) එකී බදු සංශෝධන නිසාවෙන් ඇඟළුම්, සපත්තු, ඉලෙක්ට්‍රොනික් සහ විදුලි උපකරණවල මිල කෙරෙහි සහ පිරිවැටුම කෙරෙහි ඇතිකළ බලපෑම කෙබඳු විද;

(iii) 1994 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව සහ ඒ ඒ වර්ෂයේදී එම සංචාරකයන්ගෙන් උපයන ලද විදේශ විනිමය ප්‍රමාණය දැක්වෙන වගුවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1072/’19

ගරු නිමල් ලාන්සා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010.01.10 දින සිට 2015.01.10 දින දක්වා කාලය තුළ සිදු වී ඇතැයි සැලකෙන බරපතල වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී කොමිෂන් සභාව සඳහා පත්කරන ලද සාමාජිකයන් කවරේද;

(ii) එකී සාමාජිකයන්ගේ ධූර කාලයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී පත්කිරීම් සිදු කරන ලද ගැසට් පත්‍රයේ /පත්‍රවල අංකය/අංක හා දිනය/දින කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී කොමිෂන් සභාවේ ධූර කාලය කවරේද;

(ii) එම කොමිෂන් සභාව පත් කරන ලද ගැසට් පත්‍රයේ/වල අංකය/අංක හා දිනය/ දින කවරේද;

(iii) එම ධූර කාලය දීර්ඝ කර තිබේද;

(iv) එසේ නම්, එම ධූර කාලය කවර දිනයක සිට කවර දිනයක් දක්වා දීර්ඝ කර තිබේද;

(v) එම දීර්ඝ කිරීම සිදු කරන ලද ගැසට් පත්‍රයේ/වල අංකය /අංක හා දිනය/දින කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1086/’19

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කය සඳහා දිස්ත්‍රික් ක්‍රීඩාංගණයක් ඉදිකිරීම සඳහා මුල්ලිවායික්කාල් ප්‍රදේශයේ ඉඩමක් වෙන්කර තිබුණද මේ දක්වා අදාළ දිස්ත්‍රික් ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මන්නාරම දිස්ත්‍රික්කය සඳහා වන දිස්ත්‍රික් ක්‍රීඩාංගණයේ ඉදිකිරීමේ කටයුතු කලකට ඉහතදී ආරම්භ කර 50%ක වැඩ අවසන් වීමෙන් පසු, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අදාළ ඉඩම පරීක්ෂා කළ යුතු බව දැන්වීම මත උක්ත ඉදිකිරීම් කටයුතු වසරක පමණ කාලයක් නවතා දමා ඇති බවත්;

(ii) මන්නාරම් දිස්ත්‍රික් ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු සිදුකිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තු අවසරය ලබාදී මාස 2 ක් ගතවී තිබුණද, මේ දක්වා ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) මන්නාරම දිස්ත්‍රික්කය සඳහා වන දිස්ත්‍රික් ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු යළි ආරම්භ කරනු ලබන දිනය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1116/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති ජලභීතිකා රෝගීන් සංඛ්‍යාව, එක් එක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දැනට වසරක පමණ කාලසීමාවක සිට වයඹ පළාත තුළ ජලභීතිකා රෝග මර්දන කටයුතු නිසි පරිදි සිදු නොවන බව දන්නේද;

(iii) මෙම ජලභීතිකා රෝග මර්දන කටයුතු සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පැවරීමට බලපෑ හේතු කවරේද;

(iv) එසේ වුවද, මේ වනවිට සෞඛ්‍ය දෙපාර්තමේන්තු මඟින්ද ජල භීතිකා රෝග මර්දන කටයුතු නිවැරදිව සිදු නොවන බව දන්නේද;

(v) එසේ නම්, ජලභීතිකා රෝග මර්දන කටයුතු වයඹ පළාත තුළ සාර්ථකව සිදු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 නොවැම්බර් 07 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

61/'18

ගරු හේෂා විතානගේ මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන ගුවන් විදුලි නාලිකා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුවන් විදුලි නාලිකා පවත්වාගෙන යනු ලබන ආයතන කවරේද;

(iii) එම ගුවන් විදුලි නාලිකාවල හිමිකරුවන් සහ එම නාලිකා ආරම්භ කර ඇති දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ආරම්භකර විකාශනය පවත්වාගෙන නොයන ගුවන් විදුලි නාලිකා තිබේද,

(v) එසේ නම්, එම නාලිකා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගුවන් විදුලි නාලිකා නියාමනය කරනු ලබන ආයතනය කවරේද;

(ii) දැනට එම ගුවන් විදුලි නාලිකා නියාමනය විධිමත්ව සිදු නොවන බව පිළිගන්නේද;

(iii) සමාජ හානියන් සිදුවන අයුරින් යම් යම් ගුවන් විදුලි නාලිකා මඟින් සිදු කරනු ලබන ප්‍රචාරයන් විකාශනය කිරීම වැළැක්වීම සඳහා ගුවන් විදුලි නාලිකා නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් කඩිනමින් සකස් කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

168/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ අධ්‍යාපන උපදේශක වශයෙන් සුජීව ජයසිංහ මහතා පත්කර සිටි බව දන්නේද;

(ii) එසේ නම්, ඔහු එම තනතුරට පත්කළ දිනය හා ඔහුට ගෙවන ලද මාසික දීමනා කවරේද;

(iii) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iv) විශේෂයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධව උපදෙස් ලබාදීම සඳහා ඔහු සතුව පැවති සුදුසුකම් කවරේද;

(v) මෙම පත්කිරීම සම්බන්ධයෙන් විගණන විමසුමේ දැක්වෙන කරුණු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

273/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 වර්ෂයේදී මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි "රාත්‍රි වැව" ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) ඒ සඳහා ලබාගත් පාරිසරික සහ වෙනත් අනුමැතීන් ඉදිරිපත් කරන්නේද;

(iii) මෙම ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රතිසංස්කරණ කටයුතු කවරේද;

(iv) අදාළ ඇස්තමේන්තුවේ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) මෙම ප්‍රතිසංස්කරණයේදී වැවෙහි ගැඹුර හා වර්ගඵලය වැඩි කිරීම වෙනුවෙන් වැව් පතුලේ පස් තට්ටු ඉවත් කිරීමක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(vi) එම පස් තට්ටු, ඉවත් කරන ලද ආකාරය සහ බැහැර කරන ලද ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

650/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කන්තලේ - හාතියගම ක්‍රීඩාංගණය අසල පිහිටි කිලෝ මීටර් 1.8ක පමණ දිගින් යුත් මාර්ග කොටස් කිහිපයක කාපට් ඇතිරීම සඳහා අවශ්‍ය සියලු කටයුතු සිදුකර කාපට් ඇතිරීමට පමණක් ඉතිරිව තිබියදී අධික වර්ෂාව හේතුවෙන් කල්දැමූ එම කාර්යය 2015 වර්ෂයේ සිදු වූ ආණ්ඩු වෙනස්වීමත් සමඟ අතරමඟ නැවතී ඇති බව දන්නේද;

(ii) ABC ගල්ද යොදා පාර සකස් කර ඇති බැවින්, මෙතෙක් දරන ලද වියදමින් ප්‍රතිඵලයක් ගැනීම සඳහා එම මාර්ග කොටස්වල කාපට් ඇතිරීමට පියවර ගන්නේද;

(iii) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැඩිම ජනගහනයක් ජීවත් වන හාතියගමට මෙවැනි නොසැලකීම් සිදු කරන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

781/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.08.05 දින සිට කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහකාර කළමනාකරු (මානව සම්පත් හා පාලන) ලෙස කටයුතු කළ නිලධාරියා වසර තුනක් ඇතුළත තනතුරට අදාළව පෙනී සිටිය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිට තිබේද;

(ii) උක්ත තනතුර දරන්නා එම විභාගයට පෙනී නොසිටි හෝ එම විභාගය අසමත් වූ අයෙකු නම්, වහාම එම තනතුරෙන් ඉවත් විය යුතු බව දන්නේද;

(iii) ඒ අනුව 2017.08.05 දිනෙන් පසුවද අදාළ නිලධාරියා එම තනතුරේ සේවයේ තබා ගැනීම සම්බන්ධයෙන් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

874/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරණ පාරේ පැපිලියාන සිට පාමංකඩ දක්වා වූ සංවර්ධන කටයුතු නැවැත්වීමට හේතු කවරේද;

(ii) සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය සඳහා ප්‍රචාරණය සිදු කිරීමට පෙර ඉහත වැඩ කොටස අවසන් කළ යුතු නොවන්නේද;

(iii) සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය වෙනුවෙන් උපදේශන කටයුතු සහ රජයේ උපකරණ සහ ප්‍රචාරණය වෙනුවෙන් දැනටමත් වියදම් කර ඇති ප්‍රමාණය කවරේද;

(iv) ඉහත (iii)හි දක්වා තිබෙන වියදම් කළ ප්‍රමාණයෙන් ජපානය විසින් ලබා දුන් ඩොලර් අරමුදල් ප්‍රමාණය කොපමණද;

(v) ඉහත ව්‍යාපෘතිය සඳහා සම්බන්ධවී ඇති විදේශ උපදේශකවරුන් පිළිගත් ජාත්‍යන්තර ආයතන විසින් නිර්දේශ කර තිබේද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

940/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අප රටෙහි ප්‍රධානතම රාජ්‍ය බැංකු වන ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන බැංකුවල සේවකයන් කිහිප දෙනෙකු දේශපාලන පළිගැනීම්වලට ලක්වූ බවට නිර්දේශ කරමින් උසස්වීම්, මූල්‍ය ප්‍රතිලාභ සහ විවිධ වරප්‍රසාද වරදාන ලබාදීමට විධිවිධාන යොදා ඇති බව පිළිගන්නේද;

(ii) පසුගිය රජය යටතේ බැංකුවල දේශපාලන පළිගැනීම් සිදු නොවූ බව පිළිගන්නේද;

(iii) නොඑසේ නම්, ඒ මන්ද;

(iv) බැංකු සේවක සංගමය ඇතුළු සියලු වෘත්තිකයන්ගේ විරෝධතා මැද, බැංකු ක්ෂේත්‍රයෙහි ඉතිහාසයෙහි මින් පෙර නොවූ පරිදි දේශපාලන හිතවතුන් පිරිසකට සුවිශේෂ වරප්‍රසාදයන් ප්‍රදානය කිරීමේ ඉහත වැඩපිළිවෙල වහා නැවැත්වීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1021/'19

ගරු බිමල් රත්නායක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට කුලී නිවැසියන්ට පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු කළ නොහැකිවීම, ජල බිල්පත්, විදුලි බිල්පත් ආදිය ඉදිරිපත් කළ නොහැකිවීම වැනි හේතූන් මත ඔවුන්ගේ දරුවන් පාසලකට ඇතුළත් කර ගැනීමට දුෂ්කරතා පවතින බවත්;

(ii) එලෙසම හැඳුනුම්පත් ලබා ගැනීම ද දුෂ්කර වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙවැනි අතිශය වැදගත් ගැටලුවලට විසඳුම් ලෙස ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1061/'19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැකිරාව සිට ගනේවල්පොල නගරය දක්වා දිවෙන කි. මී. 7ක පමණ දුරකින් යුත් මාර්ගය, මහනුවර - අනුරාධපුරය දක්වා දිවෙන A - 9 මාර්ගයේ කැකිරාව නගරයේ සිට අනුරාධපුර - මඩකලපුව දක්වා දිවෙන A - 11 මාර්ගයේ ගනේවල්පොල නගරයට පිවිසෙන කෙටි මාර්ගය බවත්;

(ii) මෙම මාර්ග කොටස වසර 50කට අධික කාලයකින් සංවර්ධනය කර නොමැති බවත්;

(iii) පසුගිය රජය යටතේ මෙම මාර්ගය සංවර්ධනය කිරීම ආරම්භ කළද මේ වනවිට එම කාර්යය අතරමග නතර කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා කඩිනමින් පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1117/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පඩුවස්නුවර මැතිවරණ කොට්ඨාසයේ, හෙට්ටිපොළ නමින් ප්‍රාදේශීය රෝහලක් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම රෝහල සඳහා අනුමත වෛද්‍ය කාර්ය මණ්ඩල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වනවිට එම රෝහලේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) ප්‍රදේශයට සම්පතක් වූ එම රෝහලට අවශ්‍ය භෞතික හා මානව සම්පත් ලබාදී, එම රෝහල තවදුරටත් දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1137/'19

ගරු කනක හේරත් මහතා,— සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති අපනයන සැකසුම් කලාප මෙරට ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් දක්වන්නේද;

(ii) හම්බන්තොට, මිරිජ්ජවිල සහ බිංගිරිය යන ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් නව අපනයන සැකසුම් කලාපයක් ඉදිකිරීම සඳහා මේ වනවිට වැඩ කටයුතු ආරම්භ කර තිබේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

(iv) එම අපනයන සැලසුම් කලාප ඉදිකිරීම් ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමට අපේක්ෂා කරන දිනය කවරේද;

(v) එම නව අපනයන සැකසුම් කලාප ඉදිකිරීම් අවසන් වූ පසු ඒවා මෙරට ආර්ථිකයට දායක කර ගැනීමට අපේක්ෂා කරන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1153/'19

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ, වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයට අයත්, සුඩුවෙන්දපුලවු ග්‍රාමයට ආසන්නව ඇති රාසේන්ද්‍රකුලම්හි පිහිටි රජයේ ඉඩම, 1970 වර්ෂයේ සිට එම ප්‍රදේශයේ ජනතාව විසින් හේන් ගොවිතැන් කටයුතු සඳහා සහ සත්ත්ව පාලන කටයුතු සඳහා භාවිතා කරන බව දන්නේද;

(ii) එසේ නම්, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අංක 2013/01 චක්‍රලේඛය අනුව, ඉඩම් කච්චේරි මඟින් බලපත්‍ර ලබාගැනීමට සුදුසු පුද්ගලයන් යැයි හඳුනාගත් පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම් සහ අනෙකුත් විස්තර කවරේද;

(iv) ඔවුන් අතරින් මේ වනවිට බලපත්‍රය ලබාගත් පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) හඳුනාගත් සෑම පුද්ගලයෙකුටම බලපත්‍ර ලබාදීමට පවතින බාධාවන් කවරේද;

(vi) එසේ නම්, අදාළ බාධාවන් ඉවත්කර සියල්ලන්ටම බලපත්‍ර ලබාදීමට කටයුතු කරන්නේද;

(vii) එම බලපත්‍ර ලබාදෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1156/'19

ගරු ඩී. වී. චානක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනවාරි මස සිට මේ දක්වා,

(i) නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ එම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන විසින් ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව;

(ii) "ගම් උදාව" වැඩසටහන යටතේ ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව;

(iii) නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා සිදු කරන ලද ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැය කර ඇති මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජනතාවට නිවාස ලබාදීමේදී ගෙවීමේ ක්‍රමයට නිවාස ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගෙන් අයවිය යුතු මුළු ණය මුදල කොපමණද;

(iii) "ගම් උදාව" වැඩසටහන යටතේ ඉදිකරන නිවාසවල වර්ග අඩි ප්‍රමාණය කොපමණද;

(iv) ව්‍යාපෘතියෙන් ව්‍යාපෘතියට නිවාසවල වර්ග අඩි ප්‍රමාණය වෙනස් වන්නේද;

(v) "ගම් උදාව" වැඩසටහන යටතේ ඉදිකරන නිවාසවලට මූලික සනීපාරක්ෂක පහසුකම් ලබා දෙන්නේද;

(vi) නිවාස ලබා දීමේදී නිවාසලාභීන් තෝරාගැනීම සඳහා යම් ක්‍රමවේදයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1168/'19

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ, රේගු නිලධාරීන්ගේ අතිකාල දීමනා ගණනය කිරීම ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 6.1 උප වගන්තිය යටතේ නිශ්චිතව සඳහන් කර ඇති බවත්;

(ii) ඊට අමතරව, අංක 1570/17 හා 2007.10.26 දිනැති ගැසට් පත්‍රයේ රේගු නිලධාරීන් අතිකාල සේවයේ යෙදවීම සඳහා ගාස්තු නියම කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රේගු නිලධාරීන්ට අතිකාල දීමනා ගෙවීමේදී ඉහත ගැසට් පත්‍රයේ විධිවිධාන අනුගමනය නොකරන බව දන්නේද;

(ii) ඉතා අඩු අතිකාල දීමනාවක් ගෙවීම හේතුවෙන් එම නිලධාරීන්ට බරපතළ අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, රේගු නිලධාරීන්ට නීත්‍යානුකූලව ලැබිය යුතු අතිකාල දීමනා ආයතන සංග්‍රහය ප්‍රකාරව ගණනය කර ගෙවීමට හා මෙතෙක් නියමිත පරිදි නොගෙවන ලද අතිකාල දීමනා හිඟ මුදල සමඟ ගෙවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1177/'19

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් පාලනය කරනු ලබන ළමා නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සිටින මුළු දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යාව එක් එක් ළමා නිවාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික අංශය, සමාජ සේවා සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් පාලනය කරනු ලබන ළමා නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිවාසයේ නේවාසික දරුවන් සංඛ්‍යාව, ලිපිනය හා පාලක සංවිධානයේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය වසර විස්සක කාලය තුළ මවුපිය භාරකාරත්වය නීත්‍යානුකූලව හිමිකරගෙන විදේශිකයන් විසින් භාරකාරත්වය ලබාගත් දරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී දරුවන් දැනට ජීවත් වන රට, ඔවුන්ගේ භාරකරුවන්ගේ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) රටතුළ පිහිටි කිසියම් ළමා නිවාසයකට අදාළව අධිකරණ නියෝග ලැබී තිබේද;

(ii) එසේ නම්, එකී ආයතන කවරේද;

(iii) එම නියෝගය ළමා අපචාරවලට සම්බන්ධව නම්, අදාළ චූදිතයන්ට එරෙහිව ගනු ලැබූ පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 නොවැම්බර් 08 වැනි සිකුරාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

23/'18

ගරු හේෂා විතානගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ, වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්බෑවිල හන්දියේ සිට රංවල හරහා උඩවෙල මාර්ගය වසර ගණනාවක සිට අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් දැඩි ලෙස අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය අයත්වන ආයතනය කවරේද;

(ii) මෙම මාර්ගය ගමනාගමනයට සුදුසු වන ලෙස අළුත්වැඩියා කිරීමට සැලසුම්කර තිබේද;

(iii) එසේ නම්, අළුත්වැඩියා කිරීම ආරම්භ කරනු ලබන දිනය සහ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iv) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(v) මේ වනවිට එම මුදල් වෙන්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

162/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බණ්ඩාරවෙල මහ නගර සභාව සතු වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් වාහනයේ අංකය කවරේද;

(iii) එම එක් එක් වාහනය ලබාදී ඇති නිලධාරීන් හා අංශ කවරේද;

(iv) නගර සභාව සතු වාහන වෙනත් බාහිර ආයතන වෙත ලබාදී ඇත්නම්, එසේ ලබාදුන් නිලධාරීන්ගේ හා ආයතනවල නම් කවරේද;

(v) බණ්ඩාරවෙල මහ නගර සභාව සතු වාහන වෙනත් පාර්ශ්ව වෙත ලබාදීමේදී යම් අක්‍රමිකතාවක් සිදුවී ඇත්නම්, ඒ සම්බන්ධව අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

276/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ දුප්පත්කම මනිනු ලබන ආර්ථික දර්ශක කවරේද;

(ii) ඒ අනුව, මේ වනවිට සිටින දුප්පත් ජනතාවගේ සංඛ්‍යාව කොපමණද;

(iii) ලංකාවේ දුප්පත්කම අනුව මුල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10 කවරේද;

(iv) ලංකාවේ පළාත් හා දිස්ත්‍රික්ක අනුව දුප්පත්කම පිළිබඳ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) පසුගිය වර්ෂ 10 ක කාලය තුළ ශ්‍රී ලංකාවේ දුප්පත්කම පිළිබඳ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

661/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ පිහිටි,

(i) වන රක්ෂිතයන්හි සනත්වය;

(ii) රක්ෂිතයන්හි පිහිටි වැව් සංඛ්‍යාව;

(iii) වැසි වනාන්තර හා ඒවායෙහි සනත්වය;

වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඔබ අමාත්‍යාංශය මඟින් 2017 වර්ෂය තුළ,

(i) පරිසර සංරක්ෂණය වෙනුවෙන් දියත් කළ වැඩසටහන් කවරේද;

(ii) ඒ වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) පරිසර හිතකාමී ව්‍යාපාර ඇගයීම සඳහා සිදුකළ වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) බොහෝ නගරයන් ඔස්සේ ගලන අපවිත්‍ර ජලය ගංගාවලට එක්වීමෙන් විශාල වශයෙන් ජල දූෂණය සිදු වන බැවින්, මෙලෙස අපවිත්‍ර ජලය සෘජුවම ගංගාවලට මුසුවීම වැළැක්වීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

765/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මහවැලි ගඟ මුහුදට වැටෙන ගෙන්ගේ පාලම දෙපසින් උප්පාරු හා රාල්කුලි පාලම් දෙක පිහිටා ඇත්තේ මහවැලි ගඟේ ශාඛා ජල මාර්ග දෙක මතින් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) උප්පාරු ශාඛා ඇළ මහවැලි ගඟට සම්බන්ධ වන්නේ මහවැලි ගඟේ මඩන්තෙට්ටිවලට ඉහළින් හා රාල්කුලි ශාඛාව සම්බන්ධ වන්නේ මනල්ආරුවලින් වන නමුත්, ගෙන්ගේ කලපුවේ මුහුදු ජලය මහවැලි ගඟට මිශ්‍ර වීම වැළකෙන පරිදි පිහිටා ඇති වැලිපරයෙන් වැලි කැණීමට ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ පරිදි ලබා දී ඇති වැලි කැණීම් බලපත්‍ර ප්‍රමාණය කොපමණද;

(ii) එම බලපත්‍ර ලාභීන්ගේ නම්, ලිපිනයන් හා අනුමත වැලි කියුබ් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2016 ජූනි හා 2018 මැයි භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය නිකුත් කර ඇති සමීක්ෂණ වාර්තා දෙකෙහි පිටපත් ඉදිරිපත් කරන්නේද;

(iv) එකී වාර්තාවල නිර්දේශ අනුව වැලි කැණීම් බලපත්‍ර ලබාදීමට පවතින බාධක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

798/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නිවාස සංවර්ධන අධිකාරියේ උප සභාපතිවරයා සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන්ගේ පරිහරණය පිණිස ලබා දී ඇති වාහන කවරේද;

(ii) එම වාහනවල ලියාපදිංචි අංක හා වාහන වර්ගය කවරේද;

(iii) ඒවා අතර කුලී පදනම හෝ බදු පදනම මත ලබාගත් වාහන තිබේද;

(iv) එසේ නම්, එම වාහනවල වර්ගය හා ලියාපදිංචි අංක කවරේද;

(v) 2016.01.01 සිට මේ දක්වා ඉහත (iv) හි සඳහන් එක් එක් වාහනය සඳහා මාසිකව ගෙවා ඇති මුදල කොපමණද;

(vi) මේ දක්වා මෙම වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් මාසිකව ගෙවා ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

810/’19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විශ්වවිද්‍යාල නොවන අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන මඟින් පවත්වන ඉංජිනේරු, ගණකාධිකාරි සහ වෙනත් වෘත්තීයවේදී පාඨමාලා කවරේද;

(ii) එම ආයතනවල එක් එක් පාඨමාලාව සඳහා අයකරන ගාස්තු කවරේද;

(iii) අමාත්‍යාංශය යටතේ ඇති විශ්වවිද්‍යාල මඟින් පවත්වාගෙන යනු ලබන ගාස්තු අයකරනු ලබන පාඨමාලා කවරේද;

(iv) එම පාඨමාලා සහ අයකරන ගාස්තු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2012 - 2015 කාලසීමාව තුළ ඉහත අ(ii) සහ අ(iv) පාඨමාලාවලට අදාළව ගාස්තුවල ඇති වූ වෙනස්වීම් කවරේද;

(ii) රාජ්‍ය විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන්ගේ ශිෂ්‍යාධාර රු.5000/- දක්වා වැඩි වී ඇති බව දන්නේද;

(iii) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාඨමාලා ගාස්තු වාර්ෂිකව 10%කින් ඉහළ ගියද, රු.312.50ක් වන මාසික ශිෂ්‍යාධාර මුදල වැඩිවී නොමැත්තේ මන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන තුළ පැවැත්වෙන සියලු පාඨමාලා (ප්‍රථම උපාධිය/ඩිප්ලෝමා) සම්පූර්ණයෙන් ගාස්තුවලින් නිදහස් කළ යුතු බව පිළිගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

903/’19

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010.12.10 දිනැති අංක 01/2010 චක්‍රලේඛය මඟින් ව්‍යවස්ථාපිත ආයතනවල නිලධාරින්ට සහනදායී පදනම මත වාහන ආනයනයේදී දෙවැනි වාහනය ලබාගැනීම සඳහා ලබාදී තිබූ අවුරුදු 5ක කාලය 2016.07.14 දිනැති අංක 1/2016 චක්‍රලේඛය 2015.11.21 දින සිට ක්‍රියාත්මක කිරීමෙන් අවුරුදු 10 දක්වා දීර්ඝ කිරීම හේතුවෙන් මේ සඳහා 2016 වර්ෂය තුළ සුදුසුකම් ලැබූ නිලධාරින්ට දැඩි අසාධාරණයක් සිදුවූ බවත්;

(ii) 2018.06.08 දිනැති අංක 01/2018 (1) චක්‍රලේඛය 2018.06.09 දින සිට ක්‍රියාත්මක කරමින් එම කාලසීමාව නැවත අවුරුදු 5 දක්වා අඩු කිරීමෙන් 2016 වර්ෂයේ සිට 2018.06.08 දින දක්වා විශ්‍රාම ගිය නිලධාරින්ට එම හිමිකම අහිමි වූ බවත්;

(iii) ඉහත 01/2018 (1) චක්‍රලේඛයට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණයේ 2018.06.08 හෝ 2018.06.09 ලෙස දිනයන් සඳහන් නොවීමෙන් අනෙකුත් ආයතනවල සමාන මට්ටමේ විශ්‍රාමික නිලධාරින්ට හිමිව තිබූ රුපියල් මිලියන 3.6 ක් වටිනා බලපත්‍රය 01/2018 (1) චක්‍රලේඛය මඟින් මෙම නිලධාරින්ට අහිමිකර ඇති බවත්;

(iv) ඒ අනුව, 2016 වර්ෂයේ සිට 2018.06.08 දක්වා විශ්‍රාම ගැන්වූ, 2015 චක්‍රලේඛය ප්‍රකාරව සුදුසුකම් සපුරා තිබූ සියලු නිලධාරින්ට මෙම බලපත්‍රය ලබාදෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

932/'19

ගරු මුහම්මදු නසීර් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, මාර්ග අංක 595 යටතේ පන්ගොල්ලාමඩ සිට අකුරණ, මහනුවර හරහා මහරගමට සහ කොළඹට ළඟාවන පරිදි ශ්‍රී ලංගම බස් රථයක් දිනපතා උදෑසන 4.15 ට ධාවනය වූ බව දන්නේද;

(ii) මහරගම පිළිකා රෝහලට පැමිණෙන රෝගීන් ඇතුළු මහජනතාවගේ පහසුව පිණිස ක්‍රියාත්මක වූ එම බස් සේවාව නතර කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(iii) එම බස් සේවාව අවසන් වරට ධාවනය වූ දිනය කවරේද;

(iv) එම බස් සේවාව සතියේ සෑම දිනකම ධාවනය කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

939/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2018 දක්වා,

(i) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහල් ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් කොපමණද;

(ii) සහල් ආනයනය කිරීම සඳහා වැයකළ විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(iii) සහල් ආනයනය කිරීම සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධනය කළ ආකාරය කවරේද;

(iv) රාජ්‍ය ආයතන විසින් ආනයනය කළ සහල් ප්‍රමාණයන් සහ එම ආයතන විසින් සහල් අලෙවියෙන් ඉපැයූ ලාභය හෝ සිදු වූ අලාභය කොපමණද;

යන්න එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

968/'19

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ස්වේච්ඡා පොලිස් කොස්තාපල්වරුන් ලෙස සේවය කළ පුද්ගලයන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 9/1374/360/047 ට අනුව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3–II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ බවත්;

(ii) එම පිරිස ගුරු හිඟයක් පැවති වැලිඔය වැනි දුෂ්කර ප්‍රදේශවල සේවයට යෙදවූ බවත්;

(iii) මේ හේතුවෙන් ගුරු හිඟය නිසා වැසී යාමට ආසන්නව පැවති එම ප්‍රදේශවල පාසල් යළි නඟා සිටුවීමට හැකිවූ බවත්;

(iv) එසේ වුවද, ඔවුන්ගේ විරෝධය නොතකා ඔවුන් යළි ස්වේච්ඡා පොලිස් සේවයට අනුයුක්ත කිරීමේ උත්සාහයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඔවුන්ගේ ඉල්ලීම පරිදි එම පිරිස ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථිර කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

977/'19

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අත්‍යවශ්‍ය නොවන නිලධාරින්ගේ අතිරික්තයක් සහ අත්‍යවශ්‍ය නිලධාරින්ගේ ඌනතාවයක් පවතින බව දන්නේද;

(ii) එම නිලධාරින් සංඛ්‍යාව තුලනය කර මහජනතාවට වඩාත් ඵලදායී සේවාවක් ලබාදීමට අවශ්‍ය කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1003/'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2019 මාර්තු 18 දින කොළඹ, ෂැංග්‍රිලා හෝටලේ පැවති "සුපිලිපන් මන්ත්‍රණය" නමැති රාජ්‍ය සේවයේ අල්ලස් තුරන් කිරීම සඳහා පස් අවුරුදු සැලැස්ම එළි දැක්වීමට පැවති උත්සවය සංවිධානය කරන ලද ආයතනය කවරේද;

(ii) එම උත්සවය සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(iii) එම උත්සවයට සහභාගී වූ ආරාධිතයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා මුදල් වියදම් කළ ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1023/'19

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ 5 තුළ,

(i) සුරාබදු පනතේ 58 "අ" වගන්තිය යටතේ සුරාබදු නිලධාරීන්ට ත්‍යාග ප්‍රදානය සඳහා වූ අරමුදලෙන් 818 නිවේදනය උල්ලංඝනය කරමින් මූල්‍ය අක්‍රමිකතාවයන් සිදු කිරීමට අනුමතිය දී ඇත්තේ කවුරුන්ද;

(ii) එම නිවේදනයට අනුව ආදායම් එකතු කරන නිල ඇඳුම් අඳින කාර්ය මණ්ඩලයේ 1200කට සහ ආදායම් එකතු නොකරන නිල ඇඳුම් නොඅඳින නිලධාරින් 150කට වාර්ෂිකව ගෙවූ මුදල සහ එය අරමුදලේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) එම නිවේදනයේ (vi) යටතේ දක්වා ඇති විශේෂ කොන්දේසිවල සීමාවට ළඟා නොවූ නිල ඇඳුම් අඳින නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 5.2 වගන්තිය කඩකරමින්, පසුගිය වර්ෂ 5 තුළ නීත්‍යානුකූළ නොවන ගෙවීම් සිදු කිරීමට අනුමතිය දී ඇත්තේ කවුරුන්ද;

(ii) 7.2 - iiහි හිමිකම් කිවහැකි කාර්ය මණ්ඩලයට පසුගිය වර්ෂ 5 තුළ කොපමණ ප්‍රමාණයක් ඉක්මවා ගෙවීම් සිදුකර තිබේද; එය සමස්ත තෑගි අරමුදල් ආදායමෙන් කවර ප්‍රතිශතයක්ද;

(iii) 7.2 - iiහි ශ්‍රේණිවලට, හිමි කොටසට අදාළ මුදල ගෙවා ඉතිරිය 5.2 යටතේ නීත්‍යානුකූල නොවන බැර කිරීම් සිදුකර තිබේද;

(iv) ඉහත නීති විරෝධී අසමතුලිත මුදල් ගෙවීම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1034/’19

ගරු කනක හේරත් මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සීපෝත් වසම තුළ පිහිටි සෙන්ට් කැතරින් වත්ත කැළණි ගඟේ ජල පෝෂක ප්‍රදේශයක් හා ගෝණුන්, මුවන් වැනි සතුන්ගේ නිජ භූමියක් වන බවත්;

(ii) දේශීය සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක් වූ ප්‍රදේශයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම වතුයායෙහි අක්කර 50ක කොටසක් වෙන් කර එක් පුද්ගලයෙකුට හෝ පිරිසකට ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මැනීම් කටයුතු සිදු කරන්නේද;

(iii) එම මැනීම් කටයුතු රජයේ නිවාඩු දිනවලදී හොර රහසේ සිදු කිරීමට හේතුව කවරේද;

(iv) 2010 වර්ෂයේ සිට මෙම ප්‍රදේශය සම්බන්ධයෙන් පෞද්ගලික අංශ විසින් සිදු කරන ලද ඉල්ලීම් පාරිසරික වැදගත්කම හා එල්ල වූ ජනතා විරෝධය හේතුවෙන් ප්‍රතික්ෂේප වුවද, මෙම තත්ත්වය යටතේ එම ගැටලු නැවත උද්ගත නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?